# යාපනය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

## උප කුලපති තනතුර

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වැනි වගන්තිය සහ ඉන් පසුව සිදු කළ සංශෝධනයන් ප්‍රකාරව ක්‍රියා කරන ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ පාලක සභාව යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර සඳහා අයදුම්පත්/ නාම යෝජනා කැඳවනු ලැබේ. අයදුම්කරුවන් / නම් කරන තැනැත්තෝ ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර වයස අවුරුදු 63 ට අඩු විය යුතුය. සාර්ථක අයදුම්කරු / නම් කරන තැනැත්තා පත්වීමේ දිනයේ සිට වසර තුනක කාලයක් හෝ ඔහු / ඇය 65 වන වසර සම්පූර්ණ වන තුරු, මෙයින් පෙර සිදු වන දෙයක් සඳහා ධුරය දරනු ඇත.

යාපනය විශ්ව විද්‍යාලයේ දැක්ම වන්නේ ඉගැන්වීම, ඉගෙනීම, පර්යේෂණ සහ ශිෂ්‍යත්ව යන අංශවල විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමයි. එහි ප්‍රමුඛතා වන්නේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සහ විශේෂයෙන් උතුරු කලාපය සහ පොදුවේ රටේ සංවර්ධනයට අදාළ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමයි. මෙම විශ්ව විද්‍යාලය යාපනයේ හි පීඨ අටක් සහ කිලිනොච්චියේ හි පීඨ තුනක් (සමස්තයක් ලෙස පීඨ 11ක්), ඔස්සේ ආසන්න වශයෙන් උපාධි අපේක්ෂකයින් එකොළොස් දහස් හයසියයක් සහ පශ්චාත් උපාධි සිසුන් හයසියයක් පමණ වන ජනගහනයකට වෘත්තීමය හා ප්‍රතීතනය ලත් උපාධි පාඨමාලා සපයයි. උපකුලපතිවරයා මෙම ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම හා සහාය දීම අපේක්ෂා කෙරේ.

උපකුලපතිවරයා ඔහුගේ / ඇයගේ බුද්ධිමය මෙන්ම කළමනාකරණ දක්ෂතාව තුළින් විශ්ව විද්‍යාලයේ දැක්ම සහ අරමුණු ඉදිරියට ගෙන යාමේ දැක්මක් ඇති පුද්ගලයෙකු විය යුතුය. මෙයට අමතරව, උසස් අධ්‍යාපනයේ ජාතික ප්‍රතිපත්ති අනුව ජාතියේ අවශ්‍යතා හඳුනා ගැනීමට උපකුලපතිවරයාගෙන් ඉල්ලා සිටී. උපකුලපතිවරයාට තම නායකත්වය සහ පර්යේෂණ හා සංවර්ධන ඇතුළු අධ්‍යයන කටයුතු තුළින් විශ්වවිද්‍යාලයේ ප්‍රගමනය සඳහා කාලය විසින් පරීක්ෂා කරන ලද වටිනාකම් ශක්තිමත් කිරීමට හැකි විය යුතුය. එබැවින් අයදුම්කරු / නම් කරන තැනැත්තා ශක්තිමත් පර්යේෂණ පැතිකඩක්, ඔප්පු කරන ලද නායකත්ව ගුණාංග සහ විවිධ උනන්දුව දක්වන කණ්ඩායම් සමග අන්තර් ක්‍රියා කිරීමට අන්තර් පුද්ගල කුසලතා, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ විශිෂ්ට ජයග්‍රහණ පිළිබඳ වාර්තාවක් සහිත උසස් අධ්‍යාපනික හා අවංක පුද්ගලයකු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ විවිධ අවශ්‍යතා උත්තේජනය කිරීමේ හැකියාව සමග විශිෂ්ට සන්නිවේදන කුසලතා සහිත තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි විය යුතුය.

උපකුලපතිවරයා විශ්ව විද්‍යාලයේ පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර, ප්‍රධාන විධායක මෙන්ම ප්‍රධාන අධ්‍යයන නිලධාරියා ද වේ. උපකුලපතිවරයා විශ්ව විද්‍යාලයේ ගණකාධිකාරීවරයා ද වේ. ඔහු / ඇය නිල සාමාජිකයෙක් වන අතර පාලක සභාවේ සහ සනාතන සභාවේ සභාපතිවරයා වේ. ඔහු / ඇය විශ්ව විද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම දරයි. විශ්ව විද්‍යාල පනතේ විධිවිධාන සහ සුදුසු උපකරණයන් නිසි ලෙස පිළිපැදීම සහතික කිරීම උපකුලපතිවරයාගේ යුතුකම වන අතර, ඒ සඳහා ඔහු / ඇය අවශ්‍ය යැයි සිතිය හැකි සියලු බලතල ක්‍රියාත්මක කළ යුතුය. අධ්‍යයන නායකත්වය සැපයීම සඳහා උපකුලපතිවරයා වගකිව යුතු අතර, විධිමත් කළමණාකරණ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, හඳුන්වාදීම හා මෙහෙයවීම සහ විශ්ව විද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය යන පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම දරයි. එබැවින් අධ්‍යයන විශිෂ්ටත්වය සහ යහපාලනය පිළිබඳ මූලධර්ම පිළිගත යුතුය. විනිවිදභාවය, වගකීම, ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය සහ ඵලදායී පක්ෂග්‍රාහී නොවන නායකත්වයක් පවත්වා ගැනීම සඳහා උපකුලපතිවරයා වගකිව යුතුය.